*සැ. යු.* - (i) 2020.08.07 දින පළ වූ අංක 2,188 දරන *ගැසට් පත්‍රයේ* II කොටස පළ නොවීය.
(ii) මෙවර පළවන *ගැසට් පත්‍රයේ* VI කොටසේ ලියාපදිංචි පශු වෛද්‍ය නිලධාරීන්ගේ නාමාවලියක් ඉංග්‍රීසි භාෂාවෙන් පළ වේ.

# ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ගැසට් පත්‍රය

**අංක 2,189 - 2020 අගෝස්තු මස 14 වැනි සිකුරාදා - 2020.08.14**

(රජයේ බලයපිට ප්‍රසිද්ධ කරන ලදී)

## IV(ආ) වැනි කොටස - පළාත් පාලනය

(වෙන වෙනම ගොනු කර ගත හැකි පරිදි සෑම කොටසකට ම අයත් එක් එක් භාෂාවකට වෙන වෙනම පිටු අංක යොදා ඇත)


| | පිටුව |
|---|---|
| තනතුරු- ඇබෑර්තු .... ... ... | — |
| විභාග, විභාග ප්‍රතිඵල ආදිය ... ... ... | — |
| බඩුබාහිරාදිය විකිණීම් ... ... ... | — |
| පළාත් පාලන නිවේදන ... ... ... | 1484 |
| අතුරු ව්‍යවස්ථා ... ... ... | — |
| පළාත් පාලන සහ ඡන්ද ආඥාපනත යටතේ දැන්වීම් .. | — |
| ආදායම් හා වියදම් පිළිබඳ ප්‍රකාශන ... ... | 1504 |
| අයවැය ලේඛන ... ... ... | — |
| දේපළ විකිණීම් ... ... ... | — |
| විවිධ දැන්වීම් ... ... ... | 1507 |


**සතිපතා නිකුත් වන ගැසට් පත්‍රයෙහි පළකිරීම සඳහා භාරගනු ලබන දැන්වීම් පිළිබඳ**
**වැදගත් නිවේදනයයි**

ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ *ගැසට් පත්‍රයේ* අවසන් පිටුවේ සෑම මාසයක ම මුල් සතියේ දී පළ කරන නිවේදන භාරගන්නා දිනයන් සහ වේලාවන් පිළිබඳව මින් අවධානය යොමු කරනු ලැබේ.

*ගැසට් පත්‍රයේ* පළ කිරීම සඳහා දැන්වීම් භාරගැනීම *ගැසට් පත්‍රය* පළකරනු ලබන දිනයට සති දෙකකට පෙර සිකුරාදා දිනයෙහි දහවල් 12.00 ට අවසන් කරනු ලැබේ. තනතුරු - ඇබෑර්තු, විභාග, ටෙන්ඩර් සහ වෙන්දේසි පිළිබඳ දැන්වීම්වල අවසන් දින සහ වේලාවන් ඒ පිළිබඳව උනන්දුවක් දක්වන අයට ප්‍රමාණවත් කාල වේලාවක් ලැබෙන පරිදි යොදාගත යුතු බවට, සියලු ම දෙපාර්තමේන්තු, සංස්ථා සහ මණ්ඩල යනාදිය වගබලාගත යුතු බව මින් අවධාරණය කෙරේ. පළකිරීම සඳහා එවනු ලබන සෑම දැන්වීමක් ම තනි පැත්තේ පමණක් පැහැදිලිව පිටපත් කළ යුතු ය. **නිරවද්‍යතාවය පිළිබඳව කරන විමසීම් සහ පැමිණිලි ගැසට් පත්‍රය පළ වූ දින සිට තෙමසකට පසුව භාරගනු නොලැබේ.**

*ගැසට් පත්‍රයේ* පළ කරන සෑම දැන්වීමක් ම *ගැසට් පත්‍රය* පළකරනු ලබන දිනට සති දෙකකට පෙර එනම්, 2020 සැප්තැම්බර් මස 04 වැනි දින පළකරන *ගැසට් පත්‍රයේ* දැන්වීම් 2020 අගෝස්තු මස 21 වැනි දින දහවල් 12.00ට හෝ ඊට පෙර තැපැලෙන් හෝ ගෙනවිත් රජයේ මුද්‍රණාලයට භාරදිය යුතු ය.

**2006 අංක 19 දරන ඉලෙක්ට්‍රොනික ගනුදෙනු පනත - 9 වැනි වගන්තිය**

*"යම් ප්‍රකාශනයක්, රීතියක්, නියෝගයක්, නියමයක්, අතුරු ව්‍යවස්ථාවක්, නිවේදනයක් හෝ වෙනත් කිසිවක් ගැසට් පත්‍රයේ පළ කළ යුතු බවට යම් පනතකින් හෝ නීති ප්‍රඥප්තියකින් විධිවිධාන සලස්වා ඇති අවස්ථාවක, ඒ රීතිය, නියෝගය, නියමය, අතුරු ව්‍යවස්ථාව, නිවේදනය හෝ වෙනත් දෙය ඉලෙක්ට්‍රොනික ස්වරූපයේ වන ගැසට් පත්‍රයක පළ කරනු ලැබුවහොත් ඒ විධිවිධානය සම්පූර්ණ කර ඇත්තාක් සේ සැලකිය යුතු ය."*

**ගංගානි ලියනගේ,**
රජයේ මුද්‍රණාලයාධිපති.

2020 ජනවාරි මස 01 වැනි දින,
කොළඹ 08,
රජයේ මුද්‍රණ දෙපාර්තමේන්තුවේ දී ය.

මෙම *ගැසට් පත්‍රය* www.documents.gov.lk වෙබ් අඩවියෙන් බාගත කළ හැක.

# පළාත් පාලන නිවේදන

## මොරටුව මහා නගර සභාව

මෙහි පහත උපලේඛනයෙහි සඳහන් අය විසින් එම උපලේඛනයෙහි සඳහන් ස්ථානයේ මස් වෙළෙඳම පවත්වාගෙන යාම පිණිස 2020 වර්ෂයට විශේෂ බලපත්‍රය ඉල්ලුම් කර ඇත. ඒ අනුව විශේෂ බලපත්‍ර නිකුත් කිරීම සඳහා මොරටුව මහා නගර සභා සීමාව තුළ පදිංචි යම් අයෙක් විරුද්ධ වන්නේනම්, එසේ විරුද්ධවීමට හේතු සඳහන් කර පිටපත් දෙකකින් යුක්තව මෙම දැන්වීම *ගැසට් පත්‍රයේ* පළ වූ දින සිට දින 14 ඇතුළත මා වෙත ලියා එවීමට බලය ඇති බවත් (272 වැනි අධිකාරිය) සෝසාතක ආඥා පනතේ 7 වැනි වගන්තිය යටතේ මෙයින් දැනුම් දෙනු ලැබේ.

එස්. ඩී. තෙවරප්පෙරුම,
නාගරික කොමසාරිස්,
මොරටුව මහා නගර සභාව.

2020 ජූලි 07 වැනි දින,
මොරටුව මහා නගර සභාවේ දී ය.

| *අනු. අංකය* | *ඉල්ලුම්කරුගේ නම හා ලිපිනය* | *ව්‍යාපාරය පවත්වාගෙන යන ස්ථානය* | *වෙළඳ ව්‍යාපාරයේ ස්වභාවය* | *වෙළඳ ව්‍යාපාරයේ නම* |
|---|---|---|---|---|
| 1 | ඩබ්.පී.ශාන් නිලංග ද සිල්වා මයා අංක 25/8/බී, 4වන පටුමග, පාතිමා මාවත, කඳාන. | අංක 4බී, පුවක් අරඹපාර, මොරටුමුල්ල බටහිර, මොරටුව | කුකුල් මස් හා ඌරු මස් විකිණීම | නිලංග ෆාම් ෂොප් |

08-179

---

## හාරිස්පත්තුව ප්‍රාදේශීය සභාව

### 1987 අංක 15 දරන ප්‍රදේශීය සභා පනතේ 24(1) වගන්තිය යටතේ කරනු ලබන දැන්වීමයි

අංක 1974 හා 2019.10.25 දින දරන *ගැසට් පත්‍රයේ* IV(ආ) කොටසෙහි ප්‍රසිද්ධ කිරීමට යෙදුන පහත සඳහන් මාර්ගය සම්බන්ධයෙන් විරෝධතා ඇති බවට ඉදිරිපත් වී නොමැති බැවින් ප්‍රාදේශීය සභා පනතේ 24 වන වගන්තිය ප්‍රකාරව එම මාර්ගය ප්‍රාදේශීය සභාව සතු මාර්ගයක් ලෙස සලකා කටයුතු කෙරෙන බව මෙයින් නිවේදනය කරමි.

එච්. ඒ. ආනන්ද ජයවිලාල්,
සභාපති,
හාරිස්පත්තුව ප්‍රාදේශීය සභාව

මාර්ගයේ නම - අමුණුකඩුල්ල
ආරම්භය - කටුගස්තොට කුරුණෑගල ප්‍රධාන මාර්ගයේ 5 කණුව අසලින්

අවසානය - ඇඹුල්පුරය ගම්මානය කෙළවර දක්වා

දිග අඩි - 1400

පළල අඩි - 10

08-249

## දික්වැල්ල ප්‍රාදේශීය සභාව

### 1987 අංක 15 දරන ප්‍රාදේශීය සභා පනතේ 24 (1) (ආ) වගන්තිය යටතේ කරනු ලබන දැන්වීමයි

1989 අංක 15 දරන ප්‍රාදේශීය සභා පනතේ 24 (I) වගන්තිය ප්‍රකාරව දකුණු පළාතේ මාතර දිස්ත්‍රික්කයේ දික්වැල්ල ප්‍රාදේශීය සභාව විසින් මෙහි පහත සඳහන් උපලේඛනයේ දක්වා ඇති මංමාවත් දික්වැල්ල ප්‍රාදේශීය සභාවේ 2020.06.23 වැනි දින පැවති මහා සභා රැස්වීමේ තීරණ අංක 5.1.5 සහ 5.1.6 යටතේ දික්වැල්ල ප්‍රාදේශීය සභාව සතු මාර්ග වශයෙන් ප්‍රකාශයට පත් කරන බව මෙයින් නිවේදනය කරනු ලැබේ.

මේ පිළිබඳව ප්‍රදේශයේ පොදු ජනතාව විසින් හෝ මංමාවත්වලට අදාළ ඉඩම්වල හිමිකරුවන් විසින් හිමිකම් පාන පාර්ශවයන් හෝ යම් විරෝධතාවයක් පළ කරන්නේ නම් මෙම නිවේදනය *ගැසට් පත්‍රයේ* පළ වූ දිනයේ සිට එක් මසක් ඇතුළත අයිතිය ඔප්පු කිරීම සඳහා 1987 අංක 15 දරන ප්‍රාදේශීය සභා පනතේ 24(2) වන වගන්තිය ප්‍රකාරව ක්‍රියාකරන ලෙසට මෙයින් දැනුම් දෙනු ලැබේ.

මෙම කාලසීමාව තුළ මෙම නිවේදනය පිළිබඳව යම් විරෝධතාවයක් පළ නොවුනහොත්, උපලේඛනයේ සඳහන් මංමාවත් දික්වැල්ල ප්‍රාදේශීය සභාව සතු මංමාවත් වශයෙන් පිළිගෙන පාලනය කරනු ලබන බව පොදු ජනතාවගේ දැන ගැනීම සඳහා මෙයින් ප්‍රකාශයට පත් කරමි.

කිත්සර මුතුකුමාරණ,
සභාපති,
දික්වැල්ල ප්‍රාදේශීය සභාව.

2020 ජූලි මස 30 වැනි දින
දික්වැල්ල ප්‍රාදේශීය සභා කාර්යාලයේ දී ය.

**උපලේඛනය**

| *අනු. අංක* | *මාර්ගයේ නම* | *මාර්ගයේ ආරම්භය* | *මාර්ගයේ අවසානය* | *දකුණුපස ඉඩම්* | *වම්පස ඉඩම්* | *මාර්ගයේ දිග (m)* | *මාර්ගයේ පළල(m)* |
|---|---|---|---|---|---|---|---|
| 1 | සමඟි මාවත | සමෘද්ධි මාවත | කරඹකොස්හේන ඉඩම | 1. පී. එච්. සමන් මහතාගේ ඉඩම | 1. අබේරත්න දිසානායක මහතාගේ ඉඩම<br>2. හසර මිහිරංග මහතාගේ ඉඩම<br>3. අනුර මහකුමාර මහතාගේ ඉඩම<br>4. එච්. ජී. කේ. ආරියසේන මයාගේ ඉඩම<br>5. එච්. ඩබ්. සෝමලතා මහත්මියගේ ඉඩම<br>6. කේ. ඩබ්. ඒ. කුලරත්න මයාගේ ඉඩම<br>7. එච්. ජී. කේ. පියසිරි මයාගේ ඉඩම | මීටර් 60ක් දුරට<br><br>මීටර් 100ක් දුරට<br>(මාර්ගයේ මුළු දිග 160) | මීටර් 03<br><br>මීටර් 2 - 2.5 අතර |
| 02 | දෙවන පටුමග | සමෘද්ධි මාවත | ඩබ්. එම්. ජී. අමරසීලි මිය ඩබ්. එම්. ජී. ආරියදාස මයා යන අයගේ ඉඩම් | 1. එල්. ජී. සුසන්ත මහතාගේ ඉඩම<br>2. එච්. යූ. නඳුන් ප්‍රදීප් නිශ්ශංක මහතාගේ ඉඩම | 1. ඩබ්. එම්. ජී. බුද්ධික සම්පත් චතුරංග මහතාගේ ඉඩම<br>2. ඩබ්. එම්. ජී. අමරලතා මියගේ ඉඩම | මීටර් 60 | මීටර් 03 |

08-418

## වරකාපොල ප්‍රාදේශීය සභාව

### ග්‍රාමීය මාර්ග නම් කිරීම සම්බන්ධව කරනු ලබන දැන්වීම

වරකාපොල ප්‍රාදේශීය සභාවේ 2019.11.07 දින මහ සභා රැස්වීමේ තීරණ අංක ඉ-11 යටතේ සම්මත වී ඇති පහත නම සඳහන් මාර්ගය, යෝජිත නම්වලින් ප්‍රකාශයට පත් කිරීම සම්බන්ධව විරෝධතා ඉදිරිපත් වී නොමැති අතර, 1975 අංක 04 දරන වීථි නම් කිරීමේ හා ස්මාරක පිහිටුවීම හා පාලනය කිරීමේ පනත යටතේ 6 වන වගන්තිය හා 1989 අංක 12 දරන අනුශංගික පනත යටතේ පළාත් සභාවේ පළාත් පාලන අමාත්‍යවරයා වෙත පැවරී ඇති බලතල හා 1987 අංක 15 දරන ප්‍රාදේශීය සභා පනතේ 198 වගන්තිය ප්‍රකාරව 2020.06.19 දිනැති ලිපිය මගින් ගරු ආණ්ඩුකාරතුමාගේ අනුමැතිය ලැබී ඇති පහත සඳහන් මාර්ගය සඳහා යෝජිත නාමය භාවිතා කරනු ලබන බව පොදු ජනතාවගේ දැන ගැනීම සඳහා මෙයින් ප්‍රකාශයට පත් කරමි.

වරකාපොල මාහේන සුදර්ශනාරාම විහාරස්ථාන මාර්ගය - "වරකාපොල භාරතී නාහිමි මාවත" ලෙස.

සභාපති,
වරකාපොල ප්‍රාදේශීය සභාව.

08-307

---

## බණ්ඩාරවෙල මහ නගර සභාව

### ස්වාධීන කණ්ඩායම් අංක 01 සඳහා වන ව්‍යවස්ථාව

### 01 පරිච්ඡේදය

1. පක්ෂයේ නම සහ බල ප්‍රදේශය : බණ්ඩාරවෙල මහ නගර සභා ස්වාධීන කණ්ඩායම් අංක 01 ලෙස යනුවෙන් හැඳින්විය යුතුය. බණ්ඩාරවෙල නගර සභා බල ප්‍රදේශය වේ.

2. සලකුණ සහ වර්ණය : එම ස්වාධීන කණ්ඩායමේ සලකුණ ඔරලෝසුව වන අතර වර්ණය කහ වර්ණය වේ. එහෙත් අවශ්‍ය විටෙක ලාංඡනය සහ වර්ණය වෙනස් කළ හැකිය.

3. අරමුණ : බණ්ඩාරවෙල මහ නගර සභා බල ප්‍රදේශයේ පළාත් පාලන මැතිවරණ සඳහා බණ්ඩාරවෙල මහ නගර සභාවට නාමයෝජනා ඉදිරිපත් කිරීමටත්, එසේ ඉදිරිපත් කිරීමෙන් පසු මැතිවරණ වලින් පසුව බණ්ඩාරවෙල මහ නගර සභාවේ පාලන බලය ලබා ගැනීමටත්, පාලන බලය ලබාගැනීමෙන් පසුව එම බල ප්‍රදේශය තුළ ජීවත් වන ජනතාවගේ අධ්‍යාපන කටයුතු සෞඛ්‍ය තත්වයන් කළමනාකරණය කිරීම, උසස් තත්වයන්ට පත් කිරීම, සර්ව ජන ඡන්ද බලය සහ ජනතාවගේ මූලික අයිතිවාසිකම් පිළිගනිමින් සමාන අයිතිවාසිකම් සැමට ලබා දීමට කටයුතු කිරීම හා ඒ අරමුණ ක්‍රියාත්මක කිරීමට අදාළව සියලුම ආනුශංගික කටයුතු ඉටු කිරීම.

4. බලාත්මක වන දිනය : 2018.12.31 වන දින සිට බලාත්මක වේ.

5. පක්ෂ සාමාජිකත්වය : මෙම ව්‍යවස්ථාව සහ ව්‍යවස්ථාවේ අරමුණ ක්‍රියාත්මක කිරීම සඳහා අවුරුදු 15ට නොඅඩු ඕනෑම අයෙකුට සාමාජිකත්වය ලබාගත හැකි වන අතර, බණ්ඩාරවෙල මහ නගර සභාවේ ස්වාධීන කණ්ඩායම් අංක 01 න් තරග කරනා අපේක්ෂකයන් සහ තරගකර බලයට පත් වන ඕනෑම සභිකයෙක් මෙම ව්‍යවස්ථාව යටතේ සාමාජිකයෙකු ලෙස පිළිගන්නා අතර, එවැනි සෑම සභිකයෙකුම මෙම ව්‍යවස්ථාවේ වගන්තිවලින් බැඳී සිටින්නේය. එසේ පිළිගත් සෑම සාමාජිකයෙකුම මෙම ව්‍යවස්ථාව පිළිගත් බවත් ඊට අනුකූලව කටයුතු කරන බවත් පිළිගත යුත්තේය.

5.1 සාමාජිකත්වය පිළිබඳ කොන්දේසි : සාමාජිකත්වය පිලිගත්තා වූ ඕනෑම අයෙකු එනම් අපේක්ෂකයෙකු හා/හෝ සභිකයෙකු පහත දැක්වෙන කරුණුවලට එකඟ විය යුතුය.

(අ) පක්ෂයේ මූලධර්ම, අරමුණු චර්යාධර්ම පද්ධතිය පිළිගැනීම

(ආ) පක්ෂය විසින් නාම යෝජනා කරන ලද සියලුම අපේක්ෂකයන්ට සහයෝගය ලබා දීම සහ ඒ ඒ අපේක්ෂකයන්ට විරුද්ධව ඉදිරිපත් වන වෙනත් තැනැත්තන්ට සහයෝගයක් නොදීම.

(ඇ) සභිකයෙකු ලෙස තේරී පත් වුවහොත් කණ්ඩායම් නායකයාගේ නීත්‍යානුකූල නියෝග පිළිපැදීම, අවනත වීම කණ්ඩායම් නායකයා විසින් ගනු ලබන තීරණ අනුගමනය කිරීම, පිළිපැදීම.

(ඈ) ස්වාධීන කණ්ඩායම 01 ලෙස හඳුන්වන කණ්ඩායම පක්ෂයක් ලෙස සැලකීම,

(ඉ) වෙනත් විවිධ දේශපාලන පක්ෂ වලට සහයෝගය ලබා නොදීම හා /හෝ ඉහත සඳහන් එකඟතාවයන්ට ප්‍රතිවිරුද්ධ වන්නා වූ කිසිදු දේශපාලන පක්ෂයකට ක්‍රියාකාරිත්වයකට සහය නොදීම.

(ඊ) කණ්ඩායම් නායකයා හා/හෝ පත් වී ඇති සභිකයෙකු හෝ සභිකයන් ප්‍රසිද්ධියේ විවේචනය නොකළ යුතු අතර කණ්ඩායම් රැස්වීමේ දී අවශ්‍ය විවේචන සිදු කළ යුතු අතර ඉන් බාහිරව සාමූහිකත්වය යන සංකල්පය බිඳ වැටෙන ලෙස විවේචනය කිරීම නොකළ යුතුය.

(ඔ) යම් සාමාජිකයෙකු පත් වූ සභිකයෙක් බවට ඡන්දයෙන් පත් වී ඇත්නම් සභාව තුලදී හෝ සභාවාර වලදී කණ්ඩායම් නායකයාගේ තීරණවලට එකඟත්වය පළ කළ යුතු අතර, ඡන්ද විමසීමකදී ප්‍රතිවිරුද්ධ පක්ෂයක යෝජනාවන්ට ඡන්ද ලබා දීම හෝ ස්වාධින කණ්ඩායම අපකීර්තිමත් වන ලෙස ඡන්දය දීමෙන් වැළකී නොසිටිය යුතුය.

6. විනය බලතල : (අ) කිසිම සාමාජිකයෙකු/සභිකයෙකු විසින් තවත් සාමාජිකයෙකුට/සභිකයෙකුට/ කණ්ඩායම් නායකයාට පරිහව කිරීම, අපහාස කිරීම, තර්ජනය කිරීම හෝ පහර දීම හෝ ප්‍රසිද්ධියේ කණ්ඩායම් ප්‍රතිපත්ති විවේචනය කිරීම හෝ වෙනත් දේශපාලන පක්ෂයකට සහාය දීම හෝ ප්‍රකාශ නිකුත් කිරීම හෝ කණ්ඩායම් ප්‍රතිපත්තියට සහ සාමූහිකත්වයට අගති දායක ප්‍රතිඵල ගෙනදෙන සහ/හෝ අපකීර්තියට පත්කරන හෝ මහජන අපකීර්තියට හේතුවන ඕනෑම ක්‍රියාවක නිරත වීම නොකළ යුත්තේය.

(ආ) ස්වාධීන කණ්ඩායම් කළමනාකරණ කමිටුවට හෝ එහි සාමාජිකයෙකුට හෝ පරිහව කිරීම, තර්ජනය කිරීම, අපහාස කිරීම නොකළ යුතුය.

(ඇ) වෙනත් පක්ෂයක හෝ ස්වාධීන කණ්ඩායමක සාමාජිකයෙකුට හෝ සභිකයෙකුට හෝ මන්ත්‍රීවරයෙකුට දේශපාලනික වශයෙන් සහාය නොදිය යුතු අතර කණ්ඩායම විසින් බණ්ඩාරවෙල මහ නගර සභාවේ බලය ලබාගෙන ඇත්නම් එම බලය අහිමිවන පරිදි වෙනත් පක්ෂයකට සහය දීම ඡන්දය ලබා දීම සභාව පැවැත්වෙන අතරතුරදී තවත් සභිකයෙකු හෝ කණ්ඩායම් නායකයා විවේචනය කිරීම නොකළ යුතුය.

(ඈ) සෑම සභියකයෙකුම ආදර්ශමත් ලෙස හා විනීතව හැසිරිය යුතු අතර, මහ නගර සභාවේ ගෞරවය රැකෙන පරිදි සෑමවිටම කටයුතු කළ යුතුය.

7. කළමනාකරණ කමිටුව : ස්වාධීන කණ්ඩායම හා එහි ප්‍රතිපත්ති ක්‍රියාත්මක කිරීම, ප්‍රතිපත්ති සකස් කිරීම, නියෝග ක්‍රියාත්මක කිරීම, උපදෙස් ලබා දීම යන කරුණු ක්‍රියාත්මක කිරීම සඳහා කළමනාකරණ කමිටුව යනුවෙන් කමිටුවක් පිහිටුවිය යුතු අතර එම කමිටුව එකොළොස් දෙනෙකුගෙන් සමන්විත විය යුතුය.

8. කළමනාකරණ කමිටුවේ සංයුතිය : කළමනාකරණ කමිටුව ගුරු වෘත්තියේ යෙනෝනෙකු, නීතිඥවරයෙකු, ව්‍යාපාර වෘත්තිකයෙකු, විශ්‍රාමික රජයේ සේවකයෙකු සහ වෙනත් සාමාන්‍ය පුද්ගලයන් හයදෙනෙකුගෙන් සමන්විත විය යුතු අතර කණ්ඩායම් නායකයා එම කළමනාකරණ කමිටුවේ ප්‍රධානියා විය යුතු වන්නේය. එම කමිටුව විනය බලධාරියා ද වන්නේ ය.

9. කළමනාකරණ කමිටු තීරණ : කළමනාකරණ කමිටුවේ තීරණය අවසන් තීරණය වන අතර තීරණාත්මක අවස්ථාවකදී කණ්ඩාම් නායකයාට තමාගේ ඡන්දයට අමතරව තීරක ඡන්දයක් හිමි විය යුත්තේය.

10. කළමනාකරණ කමිටු බලතල :
 (i) මැතිවරණයක් සඳහා අවශ්‍ය වන්නා වූ නාමයෝජනා සකස් කිරීම.
 (ii) මැතිවරණයක් තරග කිරීම සඳහා කටයුතු සම්පාදනය කිරීම.
 (iii) ව්‍යවස්ථාව සංශෝධනය කිරීම, නීතිරීති පැනවීම, ස්ථාවර නියෝග සම්පාදනය කිරීම.
 (iv) සාමාජිකයන්ගේ හා සභිකයන්ට/මන්ත්‍රීවරුන්ගේ විනය කටයුතු කිරීම
 (v) පක්ෂයේ/ස්වාධීන කණ්ඩායමේ අරමුණු ක්‍රියාත්මක කිරීම සඳහා වූ සෑම ක්‍රියාවක්ම සිදුකිරීම

11. සනපූරණය : කළමනාකරණ කමිටුවේ සනපූරණය සාමාජික ගණනින් 1/4කට නොඅඩු විය යුතුය.

12. කණ්ඩායම් නායක : කණ්ඩායම් නායකයා කණ්ඩායමේ ප්‍රධානියා වන්නේය. ඔහු විසින් නීත්‍යානුකූලව ගන්නා තීරණ කමිටුවේ අනුමැතියට යටත්ව අවසන් තීරණය බවට පත්වන්නේය.

13. අරමුදල් : ස්වාධීන කණ්ඩායම් අංක 01 සඳහා කිසිදු අරමුදලක් නොපැවැත්විය යුතු අතර අරමුදල් එකතු කිරීමට කිසිදු සාමාජිකයෙකුට හෝ සභිකයෙකුට අයිතියක් නොමැත්තේය. එහෙත් පත් වූ සභිකයන්ගේ වැටුපෙන් මන්ත්‍රී සංසද අරමුදල යනුවෙන් අරමුදලක් ආරම්භ කළ හැකි අතර එය පිළිගත් බැංකුවක තැන්පත් කළ යුතුය. එම අරමුදලින් කණ්ඩායමේ එකඟතා-වය අනුව මුදල් වැය කිරීම, ආයෝජනය කිරීම සිදු කළ හැකි අතර එය ඉතා විනිවිද භාවයෙන් සිදු විය යුතුය. එම ගිණුම ක්‍රියාත්මක කිරීමට කණ්ඩායම් නායකයා හා තවත් එක් සභිකයෙකුට බලය හිමිවන්නේය.

14. නගරාධිපති සහ නියෝජ්‍ය නගරාධිපති පත් කිරීම : කණ්ඩායම් නායකයා නගරාධිපති විය යුතු අතර නියෝජ්‍ය නගරාධිපති පත් කිරීම නගරාධිපතිගේ අභිමතය අනුව සිදුවිය යුතුය. යම් හෙයකින් නගරාධිපතිවරයාගේ ධුරය, මිය යාම, ඉල්ලා අස්වීම, හා/හෝ වෙනත් ක්‍රියාවක් හේතුවෙන් හිස්වුවහොත් නියෝජ්‍ය නගරාධිපතිවරයා නගරාධිපති විය යුතු අතර ඔහු හෝ ඇය කණ්ඩායම් නායකයා ද විය යුතුය.

15. ලේකම් : කණ්ඩායම් රැස්වීම් වාර්තා කිරීම, ලිපිගොනු භාරව ක්‍රියා කිරීම, ලිපි ගනුදෙනු කිරීම, විනය කටයුතු වලදී පවත්වන රැස්වීම් කටයුතු වාර්තා කිරීම, ස්වාධීන කණ්ඩායමේ ලිපි කටයුතු සියල්ල සිදු කිරීම සඳහා සභිකයෙකු/මන්ත්‍රීවරයෙකු නොවන අයෙකු පත් කළ යුතු වන්නේය. එම පත්කිරීමේ අභිමතය හා බලතල කණ්ඩායම් නායකයා සතු වන්නේය.

16. සාමාජිකත්වය/සභිකත්වය අහිමි වීම : ව්‍යවස්ථාවේ සඳහන් අරමුණුවලට හානිවන පරිදි චේතනාන්විතව කටයුතු කරන එසේ කටයුතු කිරීම සඳහා කල්ලි ගැසෙන කණ්ඩායම් නායකයාගේ තීරණයට පටහැනිව ක්‍රියා කරන, කණ්ඩායම් හැඟීමෙන් බැහැරව කටයුතු කරන, සභාවාරයක් පැවැත්වෙන අතරතුර වෙනත් පක්ෂයක් හෝ වෙනත් පක්ෂයක යෝජනාවක් අනුමත කරන, ඡන්දය භාවිතා කරන හා/හෝ කණ්ඩායමේ බලය අහිමි වන පරිදි ඡන්දය භාවිතා කරන, සමාජ මාධ්‍යවල පෙනී සිටිමින් ස්වාධීන කණ්ඩායමේ පැවැත්මට හානිකරන ක්‍රියාවන් හා ප්‍රකාශයන් සිදුකරන අයට විරුද්ධව විනය පරීක්ෂණ පැවැත්වීමෙන් ඒ පිළිබඳව තීරණ ගැනීමටත්, වරදකරු වේ නම් සාමාජිකත්වයෙන්/සභිකත්වයෙන් නෙරපා හැරීමටත් හැකි විය යුත්තේය. යම් සභිකයෙකුගේ සාමාජිකත්වය අහිමි කළ විට ඔහු හෝ ඇය විසින් මහ නගර සභාවේ හෝ පක්ෂයේ යම් නිලයක් දරුවේ නම් එම නිලයද අවසන් විය යුත්තේය.

17. අත්හැරුණු කරුණු : මෙම ව්‍යවස්ථාවේ ප්‍රතිපාදන සලසා නොමැති කරුණක් සම්බන්ධයෙන් යම් ප්‍රශ්නයක්, ගැටලුවක් මතුවුවහොත් රටේ පිළිගත් නීතියද උපයෝගී කළමනාකරණ කමිටුව විසින් අවශ්‍ය රීතීන් සැදිය හැකි අතර, එම රීතීන් කළමනාකරණ කමිටුවේ සාමාජිකයන්ගේ බහුතර ඡන්දයෙන් සම්මත කරගත යුතුය. එසේ සම්මත කරගන්නා යම් රීතියක් මෙම ව්‍යවස්ථාවේ කොටසක් ලෙස පිළිගැනීමට සෑම සාමාජිකයෙකුම/ සභිකයෙකුම බැඳී සිටින බවත්, එය ප්‍රශ්න කිරීමට කිසිදු සාමාජිකයෙකුට/සභිකයෙකුට අයිතියක් නොමැති විය යුත්තේය.

ජනක නිශාන්ත රත්නායක,
නගරාධිපති,
කණ්ඩායම් නායක,
ස්වාධීන කණ්ඩායම් අංක 01,
බණ්ඩාරවෙල මහනගර සභාව.

08-419

## කෑගල්ල ප්‍රාදේශීය සභාව

### 1987 අංක 15 දරන ප්‍රාදේශීය සභා පනතේ 24(3) ආ වගන්තිය යටතේ කරනු ලබන දැන්වීමයි

1989 අංක 12 දරන (අනුෂාංගික විධිවිධාන) පනතේ දෙවන වගන්තිය සමඟ කියවිය යුතු 1987 අංක 15 දරන ප්‍රාදේශීය සභා පනතේ 24(1) අ වගන්තිය ප්‍රකාරව කටයුතු කරමින් 24(1) ආ වගන්තිය ප්‍රකාරව 2020.02.14 වැනි දිනැති ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ *ගැසට් පත්‍රයේ* IV(ආ) කොටසෙහි ප්‍රකාශයට පත් කරන ලද පහත සඳහන් උපලේඛයේ සඳහන් මාර්ග කෑගල්ල ප්‍රාදේශීය සභාව සතු මාර්ග ලෙස මෙයින් ප්‍රකාශයට පත් කරනු ලැබේ.

අයි. ජගත් රවීන්ද්‍ර ජයසිංහ,
සභාපති,
කෑගල්ල ප්‍රාදේශීය සභාව,


බුළුරුප්ප,
හෙට්ටිමුල්ල.

| | | | |
|---|---|---|---|
| 01. | පාරේ නම | : | අටලාහේන අතුරු මාර්ගය |
| | වසම | : | මිනුවන්ගමුව 49 බී |
| | දිග | : | අඩි 403 (මීටර් 123) |
| | පළල | : | කැබලි අංක 01 කොටස දකුණු නැගෙනහිර කොටස අඩි 08 - අඩි 10 දක්වා ඉතිරි කොටස අඩි 10-12 |

| *පාරේ වම්පස* | *පාරේ දකුණුපස* |
|---|---|
| 1. ඇල මාර්ගය | 1. ජී. ආර්. වසන්තා නාලනී |

ආර්. කේ. නිශ්ශංක. (ලි. ප. අංකය 19940335)
ලියාපදිංචි බලයලත් මිනින්දෝරු සහ උසාවි කොමසාරිස්,
අංක 7/ 2/ 1, උසාවිය පාර,
කෑ ග ල් ල.

පිඹුරු අංකය : 2012 / 57
" සත්‍ය පිටපත "




සැබෑ පිටපතකි.
ලේකම්
කෑගල්ල ප්‍රාදේශීය සභාව

පරිමාණය 1 : 1000

සබරගමුව පළාතේ කෑගල්ල දිස්ත්‍රික්කයේ පරණකුරු කෝරළේ මාවත පත්තුවේ
මීනුවන්ගමුව ගමේ පිහිටි
බඹරදෙනියේහේන, වල්පොලමාවතේහේන, වල්පොලහේන, කංකීරියේහේන,
අටලාහේන, මද්දුමාහේන එකට යාවූ සෙන්ට්ක්ලෙයාර්වත්ත නැමති ඉඩමට
බලයලත් මිනින්දෝරු වී. එන්. කාදර් මහතා විසින් මැන සාදන ලද
අංක 1521 හි කැබලි අංක 6c න් කොටසක්
දැනට පොළවේ පිහිටි මායිම් අනුව මා විසින් මැන සාදන ලද

# පිඹුර

| කැබලි අංකය | බිම් ප්‍රමාණය | | | | විස්තරය |
|---|---|---|---|---|---|
| | හෙක්ටයාර් | අක්කර | රූඩ් | පර්චස් | |
| 1 | 0.0355 | 0 | 0 | 14.04 | පාර පළල අඩි 8 සිට 12 දක්වා |
| එකතුව | 0.0355 | 0 | 0 | 14.04 | |

බිම් කැබැල්ලේ මායිම් ඉහත දැක්වෙන පිඹුරේ පරිදි වේ.
මැනීම කළේ : 2012 - 04 - 09 වන දින දීය.
අත්සන් කළේ

2012 - 04 - 25 වන දින දීය

2019-08-06.


R. K. NISSANKA
Registered Licensed Surveyor
Court Commissioner

| | | | |
|---|---|---|---|
| 02. | පාරේ නම | : | දේවාල හන්දිය සිට පල්ලේගම හරහා ගල්කඩුල්ල දක්වා මාර්ගය |
| | වසම | : | මාබෝපිටිය |
| | දිග | : | මීටර් 47.5 |
| | පළල | : | මීටර් 3.05 |

| *පාරේ වම්පස* | | | *පාරේ දකුණු පස* |
|---|---|---|---|
| 1. | ජේ. ඒ. ඩී. පී. ජයසිංහ | - පීල්ලගාවදෙනිය කුඹුර | 1. කුඩා ඔය |
| 2. | ජේ. ඒ. යූ. ඒ. ජයසිංහ | - පීල්ලගාවදෙනිය කුඹුර | |
| 3. | එච්. ආර්. එස්. එස්. බණ්ඩාර | - පීල්ලගාවදෙනිය කුඹුර | |

එම්. ආර්. ජයතිලක බණ්ඩා ( F. S. I. )
ලියාපදිංචි බලයලත් මිනින්දෝරු
අංක 27/7 F
මීරිගැල්ල පාර
කෑගල්ල
ලි. ප. අංක 19881029
දුරකථන අංක 035-5673948

**පිඹුරු අංකය 1985**




පරිමාණය 1 : 500

සබරගමුව පළාතේ කෑගල්ල දිස්ත්‍රික්කයේ

පරණකුරු කෝරළේ කඳුඅග පත්තුවේ මාබෝපිටිය ගමේ පිහිටි පිල්ලෑගොවදෙණිය නැමැති ඉඩම තුළින් දේවාල ගෙදරගේ සිට පල්ලේගම හරහා ගල්කඩුල්ල දක්වා යෝජිත මාර්ගය සෑදීම සඳහා අවශ්‍ය බිම් කොටසක් මෙහි පෙන්වන කැබැලි 1 ක

## පිඹුර

ප්‍රමාණය:- හෙක්ටයාර් 0.0141 (අ. 0 රූ. 0 ප. 05.6)

මායිම් :-

උතුරට - පිල්ලෑගොවදෙණිය ඉතිරි කොටස
නැගෙනහිරට - පිල්ලෑගොවදෙණිය ඉතිරි කොටස සහ පිල්ලෑව
දකුණට - කුඹුර
බටහිරට - මාර්ගය

දිග :- මීටර 47.5 යි
පළල :- මීටර 3.05 යි

2019 අගෝස්තු මස 27 වැනි දින මමනින ලදී.

2019.08.28
එම්.ආර්. ජයතිලක බණ්ඩා
ලියාපදිංචි බලයලත් මිනින්දෝරු
ලි.ප.අ 19881029

සැබෑ පිටපතකි.

..............................
ලේකම්
කෑගල්ල ප්‍රාදේශීය සභාව

03. පාරේ නම : කංකීරිය නගුල්මුණුවාව වත්ත මාර්ගය
වසම : 56 රොටුව වසම
දිග : මීටර් 368.20
පළල : මීටර් 3.10

*පාරේ වම්පස*

1. ඩබ්. ජී. ගුණරත්න - හිටනාවත්ත
2. ජී. ආර්. පොඩිරාලහාමි - පල්ලෙවත්ත
3. ඒ. ඒ. මුදියන්සේ - පල්ලෙවත්ත
4. ඩබ්.ජී. තිලකරත්න, ඩබ්. ජී. ජයතිලක, ඩබ්. ජී. ගුණරත්න - පල්ලෙවත්ත
5. බී. ඒ. ගුණසේකර - ඇල්ලෙගාවහේන
6. පී. ජී. ආර්. සී. එස්. බණ්ඩාර - කොටුකෝන්ගහමුල
7. එස්. එම්. එස්. සමරකෝන් - කොටුකෝන්ගහමුලහේන
8. ඩබ්. ජී. ඩී. බිසන්ති - කොටුහේන
9. ජේ. එස්. කේ. සමරවීර - ගමගෙවත්තහේන
10. බී. ඒ. අශෝක බණ්ඩාර - ගමගෙවත්තහේන
11. පී. ජී. ආර්. එස්. බණ්ඩාර - ගමගෙවත්ත
12. පී. ජී. ආර්. ඩී. ගම්ලත් බණ්ඩාර - නගුල්මුනුවාවත්ත
එස්. එම්. පී. සමරකෝන් - නගුල්මුනුවාවත්ත

*පාරේ දකුණු පස*

1. ඒ. ඒ. එස්. යූ. කේ. අමරසිංහ - හිටිනාවත්ත
2. ඩබ්.ජී. ගුණරත්න - හිටිනාවත්ත
3. ඩබ්. ජී. ගුණරත්න - බිලිංගොල්ලේවත්ත
4. ඩබ්. ජී. තිලකරත්න - බිලිංගොල්ලේවත්ත
5. එම්. ජී. විමලාවතී - අඹගහමුලහේන
6. ඩබ්. ඒ. සෝමරත්න - අඹගහමුලහේන
7. එච්. ආර්. රූපසිංහ - අඹගහමුලහේන
8. එස්. එම්. පී. සමරකෝන් - කංකීරියගොඩවත්ත
9. පී. සී. කේ. සමරවීර - කටුකන්ගහමුලහේන
10. පී. ජී. ආර්. ඩී. ගම්ලත් බණ්ඩාර - කංකීරිය ගොඩවත්ත
11. ඩබ්. ආර්. අයි. ඒ. සමරතුංග - කංකීරියගොඩවත්ත
12. ජේ. එස්. කේ. සමරවීර - ගමගෙවත්තහේන
13. එස්. එම්. ඒ. ආර්. කේ. සමරවීර - ගමගෙවත්තහේන
14. බී. ඒ. අශෝක බණ්ඩාර - ගමගෙවත්තහේන
15. පී. ජී. ආර්. ඩී. ගම්ලත් බණ්ඩාර - ගමගෙවත්තහේන
16. බී. ඒ. ගුණසේකර - ගමගෙවත්තහේන
17. පී. ජී. පී. ඩී. ගම්ලත් බණ්ඩාර නගුල්මුනුවාවවත්ත

**P.G.R.A.DINANJAYA GAMLATH**
BSc(Surveying Sciences),
Registered Licensed surveyor & Leveller
No.41,Rockhill,
Kegalle.
035-2230887,071-9890870
e-mail-gamlathgl@gmail.com

Plan No. 0400

P.G.R.A.DINANJAYA GAMLATH
Licensed surveyor & Leveller
Regd.No: 20081742

Reference

| | |
|---|---|
| ST | Stake |
| CP | Cement Post |
| EP | Electric Pole |
| Road(PS) | Road(Pradeshiya Saba) |

Scale 1:1000

PLAN


OF

An allotment of Land marked Lot 1 being survey of the existing boundaries of defined road of KANKEERIYA–NAGULUMUNUWAWEWATTA situated at Mabopitiya villages, No.56 Rotuwa G.N.Divisions within Pradeshiya Saba Limit of Kegalle in Kanduaha Pattu of Paranakuru Korale within

KEGALLE DISTRICT
SABARAGAMUWA PROVINCE

| Lot No | Extent | | | |
|---|---|---|---|---|
| | Ha: | A: | R: | P: |
| 1 | 0.1336 | 0 | 1 | 12.83 |
| Total | 0.1336 | 0 | 1 | 12.83 |

| | |
|---|---|
| Length of Road | 368.20m |
| width of Road | 3.10m(Minimum) |




සැබෑ පිටපතකි.
ලේකම්
කෑගල්ල ප්‍රාදේශීය සභාව

Note :- 1. Boundaries surveyed as pointed out by the owners

2019.10.13

P.G.R.A. Dinanjaya Gamlath
L.S.C. Regd. No. 20081742
Registered Licensed Surveyor & Leveller

Surveyed on : 2019/10/06

| | | | |
|---|---|---|---|
| 04. | පාරේ නම | : | රොටුව හරහා උග්ගල දෙගලතිරිය මාර්ගය |
| | වසම | : | 56 රොටුව |
| | දිග | : | A සිට B දක්වා මීටර් 50 (අඩි 160) |
| | | | B සිට C දක්වා මීටර් 140 (අඩි 448) |
| | පළල | : | A සිට B දක්වා මීටර් 2.5 (අඩි 08) |
| | | | B සිට C දක්වා මීටර් 3.75 (අඩි 12) |

*පාරේ වම්පස*


1. එච්. ආර්. බණ්ඩාර - මහගෙදරවත්ත
2. යූ, එස්. අනෝමා ප්‍රියන්ති - දියලිඳ වත්ත
3. යූ. එස්. අනෝමා ප්‍රියන්ති - කෝපිගොල්ලවත්ත
4. වයි. ජී. කලුබංඩාර - අට්ටාලවත්ත

*පාරේ දකුණු පස*

1. බී. ඒ. හේරත් බංඩාර - මහගෙදරවත්ත
2. කේ. විජේරත්න බංඩා - හිටිනාවත්ත
3. එස්. ඒ. බංඩාර මැණිකේ - දියලිඳවත්ත
4. බී. ඒ. රංබණ්ඩා - දියළිඳ වත්ත
5. එච්. ආර්. එස්. ධර්මරත්න - අට්ටාලවත්ත

P.P.C. Jayasena (MSI)
Licensed Surveyor , Leveller
& Court Commissioner
Higgoda
Undugoda
Telephone No: 035-2278728
LSC Reg. No. 19991017

Plan No : 3003




Reference:-
ST- Stake
LF - Live Fence
CP - Concreet Post
Road( PS) - Road(Pradeseeya Sabha)

Scale :- 1:1000

## PLAN

Shown a Part of the Road "From Rotuwa via Uggala Degalathiriya" Situated at Rotuwa Village ( in No 56 Rotuwa GS Division of Kegalle Secretariat Division within the Pradeseeya Sabha Area of Kegalla) in Kanduaha Paththu of Paranakuru Korale, Kegalle District

SABARAGAMUWA PROVINCE

Bounded as described above

| Road | Length | | Width | |
|---|---|---|---|---|
| A-B | 50m | 160ft | 2.5m | 8ft |
| B-C | 140m | 448ft | 3.75m | 12ft |

Date of Survey :- 2019.08.26

සැබෑ පිටපතකි.

Licensed Surveyor
2019.09.16

ලේකම්
කෑගල්ල ප්‍රාදේශීය සභාව


3003 FB 2144

05. පාරේ නම : වියකුරුමඩ සියඹලාඋණුව මීගහමුලහේන හරහා මඩුපල්ල මාර්ගය
වසම : 52 සී පරණගම්පල
දිග : මීටර් 105
පළල : අඩි 12

| *පාරේ වම්පස* | *පාරේ දකුණු පස* |
|---|---|
| 1. ඒ. ප්‍රේමා රාජරත්න - වියකුරුමඩ කුඹුර | 1. ඊ. ඒ. යූ. ප්‍රියන්ත බංඩාර - වියකුරුමඩ කුඹුර |
| 2. ඊ. ඒ. යූ. ප්‍රියන්ත බංඩාර - මීගහමුලහේන | 2. ඊ. ඒ. මහින්ද සමරකොඩි - මීගහමුලහේන |

ජේ.ආර්.එම්.බණ්ඩාර ජයකොඩි,
බලපත්‍රලාභී මිනින්දෝරු,
තලමිතිකරු සහ තක්සේරුකරු,
"මහින්ද", මොලගොඩ,
කෑගල්ල.
දුරකථන:- 035-2228773
077-6251025

පිඹුරු අංකය:- 1981




සෑබෑ පිටපතකි.
ලේකම්
කෑගල්ල ප්‍රාදේශීය සභාව

2019/11/13
J.R.M. BANDARA JAYAKODY
Licensed Surveyor & Leveller
Court Commissioner & Valuer
"Mahinda" Molagoda - Kegalle.
Tel. 035-2228773
Reg. No. 1991 12 31

| | |
|---|---|
| පාරේ දිග:- | 105 මීටර්. |
| පාරේ පළල: | 12 අඩි. |

යොමුව

| | |
|---|---|
| ළ | ළී කූඤ්ඤය |
| බෝ | බෝක්කුව |
| ඉ | ඉවුර |
| ගබෑ | ගල් බැම්ම |

පරිමාණය:- 1:1000

සබරගමුව පළාතේ, කෑගල්ල දිස්ත්‍රික්කයේ, මාවත පත්තුවේ, පරණකුරු කෝරළේ, කෑගල්ල ප්‍රාදේශීය ලේකම් කොට්ඨාශයේ, කෑගල්ල ප්‍රාදේශීය සභා සීමාවේ, අංක 52C පරණගම්පොල ග්‍රාම නිලධාරී වසමේ පරණගම්පොල ගමෙහි පිහිටි "වියකුරුමඩ, සියඹලාඋණුව සහ මීගහමුලහේන" නමැති ඉඩම්වලින් කොටසක් එවායේ හිමිකරුවන් විසින් පෙන්වා දුන් ආකාරයට මැන එය කැබලි අංක 1 ලෙස යොදා පිළියෙල කරන ලද

පිඹුර

මායිම් ඉහත සදහන් පරිදි වේ

| කැබලි අංකය | ප්‍රමාණය | | | | වෙනත් කරුණු |
|---|---|---|---|---|---|
| | හෙක්ටයාර් | අ | රූ | ප | |
| 1 | 0.0410 | 0 | 0 | 16.21 | අඩි 12 පළල ප්‍රවේශ මාර්ගය |
| එකතුව | 0.0410 | 0 | 0 | 16.21 | |

මුළු බිම් ප්‍රමාණය: හෙක්. 0.0410 (අ.0 රූ.0 පර.16.21)

මැනීම කලේ:- 2019-11-03

2019/11/7
J.R.M. BANDARA JAYAKODY
Licensed Surveyor & Leveller
Court Commissioner & Valuer
"Mahinda" Molagoda - Kegalla.
Tel: 035-2228773
Reg. No: 1991 12 31

06. පාරේ නම : රොටුව වැවලහේන ගල්කොටුව පාර
වසම : 55 රොටුව
දිග : මීටර් 301.5
මීටර් 2.43 (අවම පළල)

*පාරේ දකුණු පස*

1. කේ. ශ්‍රියානි - අස්වැද්දුමේයාය
2. ඊ. ඒ. ඒ. වසන්ත කුමාර - අස්වැද්දුමේයාය ඔය රක්ෂිතය
4. ඕ. ටී. එස්. කස්තුරි ආරච්චි - කොස්ගහමුලහේන

*පාරේ වම් පස*

1. කේ. ශ්‍රියානි - අස්වැද්දුමේයාය
2. ඊ. ඒ. ඒ. වසන්ත කුමාර - අස්වැද්දුමේයාය
3. එල්. රත්නායක- අස්වැද්දුමේයාය
4. එල්.ටී. ආර්. ගුණරත්න - අස්වැද්දුමේයාය කන්කීරියහේන
5. එල්. විමලාවතී
6. එල්. රත්නාවතීමැණිකේ
7. එල්. ගුණරත්න මැණිකේ
8. එල්. ජයවර්ධන

(5-8) බෝමහන්කඩහේන

9. වයි. බී. එම්. ඩී. යාපා බණ්ඩාර - කෝන්ගහමුලහේන
10. ඕ. ටී. එස්. කස්තුරිආරච්චි - කෝන්ගහමුලහේන



Plan No. 1914
P.G.R.A.DINANJAYA GAMLATH
Licensed surveyor & Leveller
Regd.No: 20081742
Scale 1:1000
PLAN
OF
02 allotments of Land marked Lot 1 & 2 being survey of the existing boundaries of defined road of ROTUWA–WEWALAHENA–GALKOTUWA ROAD situated at Rotuwa villages, No.55 Rotuwa G.N.Divisions within Pradeshiya Saba Limit of Kegalle in Kanduaha Pattu of Paranakuru Korale
within
KEGALLE DISTRICT
SABARAGAMUWA PROVINCE
P.G.R.A. Dinanjaya Gamlath
Registered Licensed Surveyor
L.S.C. Regd. No. 20081742
Note :- 1. Boundaries surveyed as pointed out by the owner
Surveyed on : 2019/06/02
Gurugoda Oya
Bridge
Road
To Kehelwatta
From Kegalle – Bulathkohupitiya
000+0
Asweddumayaya of Mrs.K.Sriyani
Asweddumayaya of Mrs.K.Sriyani
Asweddumayaya of Mr. E.A.A.Wasantha Kumara
Asweddumayaya of Mr. E.A.A.Wasantha Kumara
Proposed Culvert
050+0
1 15.79P
Asweddumayaya of Mr.L.Rothnayake
Road To House
Asweddumayaya & Kankiriyahena of Mr.L.V.R.Gunarathne
100+0
Reservation along the Oya
Bomahankadahena of L.Vimalavathi, L.Rathnavathi Menike, L.Gunarathne Menike & L.Jayawardena
Dead Streams
Bomahankadahena of L.Vimalavathi, L.Rathnavathi Menike, L.Gunarathne Menike & L.Jayawardena
0+150
Koongahamulahena of Y.B.M.D.Yapa Bandara
200+0
Reservation along the Oya
2 15.82P
Kosgahamulahena of O.T.S.Kasthuriarachchi
0+250
Kosgahamulahena of O.T.S.Kasthuriarachchi
0+300
From Houses
සත්‍ය පිටපතකි.
ලේකම්
කෑගල්ල ප්‍රාදේශීය සභාව
Lot No | Extent Ha: | A: | R: | P:
1 | 0.0399 | 0 | 0 | 15.79
2 | 0.0400 | 0 | 0 | 15.82
Total | 0.0799 | 0 | 0 | 31.61
Length of Road 301.5m
width of Road 2.43m(Minimum)
P.G.R.A.DINANJAYA GAMLATH
BSc(Surveying Sciences),
Registered Licensed surveyor & Leveller
No.41,Rockhill,
Kegalle.
035-2230887,071-9890870
e-mail-gamlathgl@gmail.com
Reference
ST Stake
TP Telegraph Pole

07. පාරේ නම : පාරම්බේ වත්ත ඉල්වාන කොටස නිල්මිණිගම මාර්ගය
වසම : බොස්සැල්ල
දිග : මීටර් 50
පළල : අඩි 10

| *පාරේ වම් පස* | *පාරේ දකුණු පස* |
|---|---|
| 1. පාරම්බේවත්ත ඉල්වාන | 1. පාරම්බේවත්ත ඉල්වාන |

D.Rathnayake (F.S.I)
Licensed Surveyor, Leveller
Court Commissioner
Werallapatha
Rambukkana

**PLAN No : 7570C/2019**




**Scale 1 : 1000**

සැබෑ පිටපතකි.
ලේකම්
කෑගල්ල ප්‍රාදේශීය සභාව

PLAN

**Of**

**An Allotment of Land Called Parambe Estate (Ilvana Division)**
**Proposed Road For Villagers**
**Situated In**
*The Planting District of Kegalle*
Sabaragamuwa Province

Bounded as described above.

| Lot No | Containing in Extent | | | |
|---|---|---|---|---|
| | Hectares | A | R | P |
| Lot 1 | 0.0344 | 0 | 0 | 13.60 |

Length 50m. and Width 10ft

Distance A-B = 50m

*Surveyed & partitioned*
*on 15 th of April 2019*

2019-04-15

**D. Rathnayake (F.S.I)**
Licensed Surveyor, Leveller
Court Commissioner
Werallapatha,
Rambukkana


08. පාරේ නම : අලුත්දුරගේ උක්කුවාහිටියාවත්ත *හෙවත්* අඹගහමුලහේන මාර්ගය
වසම : 53 ඒ කවුඩුගම
දිග : මීටර් 77.04
පළල : මීටර් 2.44 - මීටර් 3.62

*පාරේ වම් පස*

1. ඩබ්. ඒ. සෝමදාස මයා - ඔහුට අයත් ඉඩමේ සීමාව

*පාරේ දකුණු පස*

1. එස්. එච්. සමරවීර - උක්කුවාහිටියාවත්ත
2. පී. පී. ඩී. ජයන්ත ධර්මරත්න - උක්කුවාහිටියාවත්ත
3. පී. පී. ඩී. ජයන්ත ගාමිණී පුරසිංහ - උක්කුවාහිටියාවත්ත
4. පී. පී. ඩී. මල්ලිකා - උක්කුවාහිටියාවත්ත




Scale 1:1000

PLAN

of

An allotment of Land marked lot 1 being portion of

Aluthdurage Ukkuwahitiyawatte alias Ambagahamulahena (now watte)

Depicted as Lot 6 in plan no 1289 dated 1997.02.16

prepared by Licensed Surveyor H.M.T.B.Samarasinghe, Resurveyed by me

Situated at

Kawudugama Village

No.53/A, Kawudugama Grama Niladhari Division

in Mawatha Pattu of paranakuru Korale

Kegalle D.S. Division

KEGALLE DISTRICT

SABARAGAMUWA PROVINCE

| Lot No. | Extents | | | |
|---|---|---|---|---|
| | A | R | P | Hec. |
| 1 | 0 | 0 | 10.00 | 0.0252 |

Note: Boundaries pointed out by Client
Boundaries shown in red were superimposed from Plan No.1289

D. H. RAMBUKWELLA
Registered Licensed Surveyor
and Leveller
Registration No. 19911221

Surveyed on :2019.08.25

| | | |
|---|---|---|
| 09. පාරේ නම | : | කළුගල්ල සියඹලාගස්තැන්න සිට අම්බලන් ගොඩැල්ලහේන දක්වා මාර්ගය |
| වසම | : | කළුගල්ල |
| දිග | : | 1 කොටස අඩි 131.33 (මීටර් 40.03) |
| පළල | : | 2 කොටස අඩි 211.06 (මීටර් 64.33) |

*පාරේ වම් පස*

1. කේ. ඩබ්. වසන්ත කුමාර - මොරගහවෙලහේන
2. පී. ආර්. ටී. රත්නායක - සියඹලාගස්තැන්න
3. ආර්. එම්. එම්. අනුර චමින්ද බණ්ඩාර - මොරගහවෙලහේන
4. ඊ. ආර්. පොඩිබණ්ඩා - මොරගහවෙලහේන
5. ඊ. ආර්. ඒ. උදය බණ්ඩාර - අම්බලන්ගොඩහේන

*පාරේ දකුණු පස*

1. මංජුල බංඩාර - පේරගස්තැන්නහේන

T.B.S.Sangarandeniya
Registered Licd. Surveyor & Leveller
No. 61/A ,Weralugasanga,
Dabakotuwa,
Kengalla.

Plan No. 15416




සැබෑ පිටපතකි.
ලේකම්
කෑගල්ල ප්‍රාදේශීය සභාව

SCALE :- 1 : 500

# PLAN

Of

Two Allotments of Part Of land called ' MoragahawaleHena, MoragahaweleHena & Ambalangodellehena '
Situated In Kalugalla Village
Within 12 Kalugalla Grama Niladari Division
In Kegalle Divisional Secretariat Area
In Deyala Dahamunu Pattuwa of Kinigoda Korale

## KEGALLE DISTRICT
## SABARAGAMUWA PROVINCE

| Lot No | Extent | | | Hectares | Remarks |
|---|---|---|---|---|---|
| | A | R | P | | |
| 1 | 0 | 0 | 04.94 | 0.0125 | Road [ (Wide 10 Feet,3.05 Meter), ( Length 131.33 Feet, 40.03 Meter) ] |
| 2 | 0 | 0 | 07.02 | 0.0177 | Road [ (Wide 9 Feet,2.75 Meter), ( Length 211.06 Feet, 64.33 Meter) ] |
| | 0 | 0 | 11.96 | 0.0302 | Siyambalagasthenna- Ambalangodellebena Road ( Total Length 342.39 Feet, 104.36 Meter ) |

Bounded as described above

Surveyed on: 26-09-2019

T.B.S. SANGARANDENIYA
Registered Licensed Surveyor
Reg. No: 1979/245

08-452

# ආදායම් හා වියදම් පිළිබඳ වාර්තා

## ආරච්චිකට්ටුව ප්‍රාදේශීය සභාව

### මූල්‍ය ප්‍රකාශන ප්‍රසිද්ධියට පත් කිරීම

1987 අංක 15 දරන ප්‍රාදේශීය සභා පනත ප්‍රකාරව ආරච්චිකට්ටුව ප්‍රාදේශීය සභාවේ සභාපති කේ. තෙච්චනාමූර්ති වන මම 2020.07.14 දින මහා සභා තීරණ අංක 5.01 අනුව ආරච්චිකට්ටුව ප්‍රාදේශීය සභාවේ 2019.12.31 දිනෙන් අවසන් වර්ෂය සඳහා වන මූල්‍ය ප්‍රකාශන ප්‍රසිද්ධියට පත් කිරීමට තීරණය කළ බව මෙයින් නිවේදනය කරමි.

කේ. තෙච්චනාමූර්ති,
සභාපති,
ආරච්චිකට්ටුව ප්‍රාදේශීය සභාව.

2020 ජූලි මස 14 වැනි දින,
ආරච්චිකට්ටුව ප්‍රාදේශීය සභාවේ දී ය.

**යෝජනාව**

1987 අංක 15 දරන ප්‍රාදේශීය සභා පනත ප්‍රකාර සහ 1988 ප්‍රාදේශීය සභා (මූල්‍ය හා පරිපාලන) රීති මාලාවේ 216 විධිවිධාන වලට අනුකූල වන පරිදි පහත උපලේඛන වල සඳහන් පරිදි සකස් කරන ලද ආරච්චිකට්ටුව ප්‍රාදේශීය සභාවේ 2019.12.31 න් අවසන් වර්ෂය සඳහා ආදයම් වියදම් ගිණුම, 2019.12.31 දිනට මූල්‍ය තත්ත්ව ප්‍රකාශනය සහ 2019.12.31 න් අවසන් වර්ෂය සඳහා වන මුදල් ප්‍රවාහ ප්‍රකාශනය මහජනතාවගේ දැනගැනීම සඳහා ප්‍රකාශයට පත් කිරීමට මහ සභාව යෝජනා කරන්නීය.

උපලේඛන I

**2019.12.31 දිනෙන් අවසන් වර්ෂය සඳහා ආදායම් වියදම් ගිණුම**

| | | *2019* රු. ශත | *2018* රු. ශත |
|---|---|---|---|
| 1. පුනරාවර්තන ආදයම් | | | |
| 10 | වරිපනම් හා බදු | 7,595,208.67 | 7,517,125.56 |
| 20 | කුලී | 7,990,282.21 | 9,505,303.25 |
| 30 | බලපත්‍ර ගාස්තු | 1,561,293.64 | 1,209,172.00 |
| 40 | සේවා සඳහා ගාස්තු | 1,307,477.67 | 1,134,002.42 |
| 50 | දඩ හා වරෙන්තු ගාස්තු | 11,125,199.94 | 8,750,033.45 |
| 60 | වෙනත් ආදයම් | 14,289,082.12 | 9,285,624.41 |
| 70 | ආදායම් ආධාර | 30,366,316.63 | 30,479,031.39 |
| පුනරාවර්තන ආදායම් එකතුව | | **74,234,860.88** | **67,880,292.48** |
| 2. පුනරාවර්තන වියදම් | | | |
| 01 | වැටුප් හා දීමනා | 41,207,020.87 | 36,233,864.16 |
| 02 | ගමන් වියදම් | 586,823.00 | 339,796.10 |
| 03 | සැපයුම් හා උපකරණ | 6,683,378.65 | 7,803,164.11 |
| 04 | ප්‍රාග්ධන වත්කම් අලුත්වැඩියාව හා නඩත්තුව | 5,900,248.98 | 7,094,264.88 |
| 05 | ප්‍රවාහන, සම්බන්ධතා හා සේවා | 8,621,299.10 | 6,017,136.93 |
| 06 | පොලී ගෙවීම් හා ලාභාංශ | 6,162.83 | 0.00 |
| 07 | ආධාර මුදල්, දායක මුදල් හා සහනාධාර | 770,833.01 | 202,642.54 |
| 08 | විශ්‍රාම වැටුප් හා විශ්‍රාම පාරිතෝෂික | 641,155.63 | 99,120.77 |
| පුනරාවර්තන වියදම් එකතුව | | **64,416,922.07** | **57,789,989.49** |

| | 2019<br>රු. ශත | 2018<br>රු. ශත |
|---|---|---|
| පුනරාවර්ථන වියදමට වඩා වැඩි වූ/අඩු වූ | **9,817,938.81** | **10,090,302.99** |
| ආදයම හා වියදම | | |
| 3. ප්‍රාග්ධන වියදම් | | |
| 80 මූලධන ආධාර | 525,000.00 | 3,391,878.66 |
| පුනරාවර්ථන වියදමට වඩා වැඩි වූ ආදයම් සහ ප්‍රාග්ධන ආදයම | **10,342,938.81** | **13,482,181.65** |
| 4. ප්‍රාග්ධන වියදම් | | |
| 09 උපකරණ වැය | 13,641,468.96 | 8,743,894.25 |
| අතිරික්තය හෝ ඌනතාවය | **-3,298,530.15** | **4,738,287.40** |

උපලේඛන II

**2019.12.31 දිනට මූල්‍ය තත්ව ප්‍රකාශනය**

| වත්කම් | සටහන | 31.12.2019<br>රු. ශත | 31.12.2018<br>රු. ශත |
|---|---|---|---|
| **ජංගම නොවන වත්කම්** | | | |
| දේපළ පිරියත හා උපකරණ | 06 | 210,786,789.74 | 169,762,455.07 |
| **ජංගම වත්කම්** | | | |
| තොගය | 07 | 1,434,757.89 | 1,445,409.35 |
| ආදායම් ණය ගැතියෝ | 08 | 75,842,062.45 | 67,663,268.72 |
| සේවක ණය හා අත්තිකාරම් | 09 | 7,791,835.49 | 7,173,362.69 |
| ආයෝජන | 10 | 15,921,409.85 | 5,365,247.07 |
| මුදල් සහ මුදල් හා සමාන දේවල් | 11 | 6,787,055.64 | 4,397,376.84 |
| ලැබිය යුතු ආදායම් | | 0.00 | 1,000.00 |
| | | 107,777,121.32 | 86,045,664.67 |
| **මුළු වත්කම්** | | **318,563,911.06** | **255,808,119.74** |
| **හිමිකම් හා වගකීම්** | | | |
| හිමිකම් | 12 | 283,410,614.09 | 243,874,403.15 |
| | | 283,410,614.09 | 243,874,403.15 |
| **වගකීම්** | | | |
| ජංගම වගකීම් | 13 | 35,153,296.97 | 11,933,716.59 |
| **මුළු හිමිකම් හා වගකීම්** | | **318,563,911.06** | **255,808,119.74** |

උපලේඛන III

**2019.12.31 දිනෙන් අවසන් වර්ෂය සඳහා මුදල් ප්‍රවාහ ප්‍රකාශනය**

| | *31.12.2019* *රු. ශත* | *31.12.2019* *රු. ශත* |
|---|---|---|
| **මෙහෙයුම් ක්‍රියාකාරකම් වලින් ජනිත වූ මුදල් ප්‍රවාහය** | | |
| සාමාන්‍ය මෙහෙයුම් වලින් ලද අතිරික්තය/ඌනතාවය | 9,817,938.81 | 10,090,302.99 |
| මුදල් නොවූ සිදුවීම් සඳහා සැලසුම් | | |
| ක්ෂය වීම්/පොළී | - | - |
| පාරිතෝෂික වෙන් කිරීම් | - | - |
| පෙර වර්ෂය සඳහා ගැලපීම් | 1,810,406.42 | 1,353,330.34 |
| **කාරක ප්‍රාග්ධන වෙනස්වීම් වලට පෙර මෙහෙයුම් අතිරික්තය/ඌනතාවය** | **11,628,345.23** | **11,443,633.33** |
| තොග ණය ගැතියන්/අනෙකුත් ලැබීම්(වැඩිවීම්)/අඩු වීම් | (8,785,615.07) | 11,041,908.68 |
| ණය හිමියන්/ගෙවිය යුතු දෑ වැඩි වීම/(අඩු වීම) | 23,219,580.38 | (15,686,132.48) |
| **01. මෙහෙයුම් ක්‍රියාකාරකම් වලින් ජනිත වූ ශුද්ධ මුදල් ප්‍රවාහය** | **26,062,310.54** | **6,799,409.53** |
| ආයෝජන ක්‍රියාකාරකම් වලින් ජනිත වූ මුදල් ප්‍රවාහය | | |
| දේපළ (අත්පත් කර ගැනීම්)/විකිණීම | (10,556,162.78) | |
| ප්‍රාග්ධන වියදම් | (13,641,468.96) | (8,743,894.25) |
| **02. ආයෝජන ක්‍රියාකාරකම් වලින් ජනිත වූ ශුද්ධ මුදල් ප්‍රවාහය** | (24,197,631.74) | (8,743,894.25) |
| මූල්‍ය ක්‍රියාකාරකම් වලින් ජනිත වූ මුදල් ප්‍රවාහය | | |
| ප්‍රාග්ධන ලැබීම් | 525,000.00 | 3,391,878.66 |
| ණය ගැනීම/(ආපසු ගෙවීම්) | - | |
| **03. මූල්‍ය ක්‍රියාකාරකම් වලින් ජනිත වූ ශුද්ධ මුදල් ප්‍රවාහය** | **525,000.00** | **3,391,878.66** |
| වර්ෂය තුළ ශුද්ධ චලනයන් (1+2+3) | **2,389,678.80** | **1,447,393.94** |
| වර්ෂය ආරම්භයේ මුදල් සහ මුදල් සමාන දෑ | **4,397,376.84** | **2,949,982.90** |
| වර්ෂය අවසානයේ මුදල් සහ මුදල් සමාන දෑ (සටහන II) | **6,787,055.64** | **4,397,376.84** |

*සටහන II*

| | | |
|---|---|---|
| මහජන බැංකුව - හලාවත | | |
| පොදු ගිණුම - 24100150863528 | 6,691,991.11 | 4,341,721.79 |
| සේවක ණය ගිණුම - 24100240863528 | 95,064.53 | 55,655.05 |
| අතැති මුදල් | **6,787,055.64** | **4,397,376.84** |

08-207

# විවිධ දැන්වීම්

## පේදුරුතුඩුව නගර සභාව

යෝජනාව අංක : සී 54/2020

පේදුරුතුඩුව නගර සභාවේ සභාපති යෝසෙප්පු ඉරුදයරාසා වන මම, 1939 අංක 61 දරන නගර සභා ආඥාපනතේ (255 වන පරිච්ඡේදය) 184 අ වගන්තිය සමග කියවිය යුතු එම ආඥාපනතේ 90 හා 91 වගන්තිවලින් පැවරී ඇති බලතල ප්‍රකාර පේදුරුතුඩුව නගර සභා ප්‍රදේශයේ මාර්ග වල හෝ ඒවා ආසන්නව ඇති පෙදෙස්වල බැඳ ඇති හෝ රංචු ලෙස ඇවිදින යම් ගවයෙකු හෝ එළුවෙකු අල්ලා නිදහස් කිරීමේ දී පහත සඳහන් උපලේඛනයේ 1 වන තීරුවේ සඳහන් කර ඇති කරුණු සඳහා එම උපලේඛනයේ II වන තීරුවේ සඳහන්කර ඇති ගාස්තු 2020 වර්ෂය සඳහා අය කිරීමට තීරණය කර ඇත. වැඩ කරන දින 10න් පසුව අයිතිකරුවන් ඉදිරිපත් නොවුණු ගවයන් හා එළුවන් ප්‍රසිද්ධ වෙන්දේසියට ඇතුළත් කරනු ලැබේ.

යෝසෙප්පු ඉරුදයරාසා,<br>
සභාපති,<br>
පේදුරුතුඩුව නගර සභාව.

නගර සභා කාර්යාලය,<br>
පේදුරු තුඩුව,<br>
2020 මාර්තු මස 19.

| *අනු. අංක* | *I තීරුව* | *II තීරුව රු. ශත* |
|---|---|---|
| 1 | ගවයෙකු ඇල්ලීම සඳහා ගාස්තුව | 500.00 |
| 2 | ගවයෙකු නඩත්තු කිරීම සඳහා වියදම් (දිනකට) | 500.00 |
| 3 | ගවයෙකු නිදහස් කිරීම සඳහා දඩ මුදල් | 3,000.00 |
| 4 | එළුවෙකු ඇල්ලීම සඳහා ගාස්තුව | 250.00 |
| 5 | එළුවෙකු නඩත්තු කිරීම සඳහා වියදම් (දිනකට) | 300.00 |
| 6 | එළුවෙකු නිදහස් කිරීම සඳහා දඩ මුදල් | 2,000.00 |

08-184

ශ්‍රී ලංකා රජයේ මුද්‍රණ දෙපාර්තමේන්තුවේ මුද්‍රණය කරන ලදී.